




පිපිරුණු බස් රථය

# කටුබැද්දේ බෝම්බ පිපිරුණු දා



මියගිය අයගේ ඥාතීහු හඩා වැළපෙති

සිවිල් වැසියන් 21 දෙනෙකුට මරු කැඳවමින් තවත් හතළිස් ගණනකට බරපතල තුවාල සිදුකරමින් ගිය සතියේ 6 වෙනි දි උදෑසන 7.45 ට පිලියන්ද මොරටුව මාර්ගයේ ධාවනය වූ මාර්ග අංක 255 බස්රථයක් කටුබැද්දේ ශෛලබිම්බාරාමය විහාරස්ථානය අසළ දී ක්ලේමෝ බෝම්බයක් කොටිත්‍රස්තවාදීන් විසින් පුපුරවා හරින ලදී. එහි සිටි මගීන් අතර බොහෝ දෙන ශිෂ්‍ය ශිෂ්‍යාවෝය. මුළු මොරටුවම එකම මළගෙයක් වීය. ඒ උදෑසන ඒ බසයෙන් ගමන්ගත්තේ රැකියාවට යන අයත් පාසැල් යන ළමයිනුත්ය. බෝම්බය ඊට කලින්දා රැයේ පාරේ අටවා තබන්නට ඇතැයි ද එය දුරස්ථ පාලකයකින් අවුළුවන්නට ඇතැයිද දැන් සොයාගෙන ඇත. ත්‍රස්තවාදීන් රැයේ බෝම්බය සැළසුම් කරද්දී බුරාගෙන ආ බල්ලන්ට වස දමා කෑම දී ඇති බවත් ඉන් බල්ලන් මියගොස් ඇති බවත් පොලීසිය කියයි. එදින එම කටුබැද්ද සහ පිළියන්දල මාර්ගය වසා අඳුරුනීතිය පනවා පුද්ගල සෝදා-සියක පොලීසිය නිරතවී ඇත. ඒ අනුව සැකරුවන් හැට පහක් අත්අඩංගුවට ගත් බව ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් මාධ්‍යයට පැවසීය. තුවාලකරුවන් කඩිනමින් කළුබෝවිල රෝහලට ගෙනගොස් ඇත.

## එදාම දෙවන බස් බෝම්බය පොල්ගොල්ලේ දී

මිලේච්ඡ කොටි ත්‍රස්තවාදීන් කටුබැද්දේ බෝම්බයෙන් පැය අටකට පසුව වත්තේගම සිට මහනුවර බලා ආ බස්රථයක් තුළද බෝම්බයක් පුපුරවා හැර ඇත. එය සිදුවූයේ හරියටම පොල්ගොල්ල ගුරු අභ්‍යාස විද්‍යාලය ඉදිරිපිටය. එක් අයෙක් ඉන් මියගිය අතර 12 දෙනෙක් තුවාල ලැබූහ.

## ගල්කිස්සේදී තවත් ක්ලේමෝ බෝම්බ අසුවේ

අත්අඩංගුවේ පසුවන කොටිසැකකරුවෙකු දුන් තොරතුරු අනුව ගල්කිස්ස පොලීසිය විසින් වටරප්පල අබේසේකරාරාම පාරේ තැනක වළලා තිබූ ක්ලේමෝ බෝම්බ කීපයක් සොයාගෙන ඒවා නිෂ්ක්‍රීය කරන ලදී. ඒවා කොළඹම විවිධ තැන්වලට යැවීමට සූදානම්කර තිබූ ඒවා ය.

එසේම ඊට පෙරදා හැන්දෑවේ ලැබුණු තවත් ඔත්තුවක් මත රාගම මහබාගේදී විශාල ක්ලේමෝ බෝම්බයක් හමුදාවේ බෝම්බ නිෂ්ක්‍රීය ඒකකය මගින් සොයාගෙන විනාශ කරන ලදී. එම බෝම්බය විශාල හානියක් සිදුකරන්නට සැළසුම් කළ එකක් බව හමුදාව කියයි.



# බරකරත්ත විරෝධය

එක්සත් ජාතික පක්ෂය දැනට පසුගිය මැයි 27 වෙනි දින කොළඹ නගරයේ බරකරත්ත ගණනාවක් ගෙනවුත් පෙළගස්වා පෙළපාලියක් යමින් රජයට විරෝධය පෑවේය. ඒ, තෙල් මිළ ඉහළයෑම, බඩු මිළ නැගයෑම, බස් සහ දුම්රිය ගාස්තු වැඩිකිරීම හා විදුලිය ගාස්තු ඉහළයෑම ආදියට එරෙහිවය. මෙම කරත්ත පෙරහැර කොළඹ කොටුවේ දුම්රිය පළේ සිට මරදාන කාර්මික විද්‍යාලය හරහා ඩීන්ස් පාර දිගේ නගර සභා පිටිය දක්වා ගමන් කළේය. මෙහි මූලිකත්වය ගෙන ක්‍රියා කළේ රවී කරුණානායක, ජයලත් ජයවර්ධන හා ජෝන් අමරතුංග යන මන්ත්‍රීවරුන්ය.

අවසානයේ වූ රැස්වීම ඇමතූ පක්ෂ ලේකම් තිස්ස අත්තනායක මහතා රාජපක්ෂ රජය ජනතාව මෙතරම් තලද්දී පෙලද්දී එයට බලයට ඒමට උදව්කළ ජාතික හෙළ උරුමය හා ජනතා විමුක්ති පෙරමුණ යන දෙගොල්ලම දැන් නිහඬව සිටින බවත්, ජනතාව ඒකරාශීව රජය පරාජය කළ යුතු බවත් අවධාරණය කළේ ය.

## ♥ පැටියො ඩාලිං



" පැටියො මේ පත්තරේ තියනවා පැට්‍රල් ඩීසල් වැඩිවෙලා කියලා ලංකාවෙ විපක්සෙ මන්ත්‍රී වරු බරකරත්තවල නැගලා කොළඹ පුරාම විරෝධ පෙළපාලියක් ගියයි කියලා. "

" අනේ ඒක හොඳයි....... ගොන්කම කියන වචනෙ තේරුම එදා තමයි ඒ කරත්ත ඇදපු ගොන්නුත් වටපිට බලලා පළමුවෙනි වතාවට හරියටම දැනගන්න ඇත්තෙ. "

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432

# Sinhala Lesson 122 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

## The Present Participle - මිශ්‍ර ක්‍රියාව

පෙරහැරේ නැට්ටුවෝ බෙරගසමින් නටති

In each of the following sentences, the two verbs are joined by the conjunction **'and'.** When it is said in Sinhala, one verb is turned into a **Present Participle**, while the other is the **finite verb**.

**Translate the following into Sinhala.**

**1.** All the people sang and danced at the party.
**2.** This man is snoring and sleeping.
**3.** We were playing and bathing in the river.
**4.** You are laughing and eating the cake.
**5.** I am drinking tea and reading a magazine.
**6.** The soldiers will kiss and embrace their family.
**7.** The children are cleaning and decorating their school.
**8.** Some traders buy and sell used cars.

- Make your own Sinhala sentences with the **Present Participles** you have already learnt.
- Try to recognise Present Participles in your reading.
- Practice speaking, reading and writing Sinhala.

♦ ආචාර්ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 99

**හරහට :**
1 සුන්දරත්වය
4 සිදුර 5 දිවට දැනේ
7 ඉන්න හිටින තැන්
9 විසාල යන අරුත ඇත
11 පෝය දවසකි

**පහළට :**
1 මෙය කාන්තාවකගේ හැඩ වැඩි කරයි
2 වානර පවුලේ කෙනෙකි
3 එන්න
6 රණවිරුවෙකු උපන් ගම
8 මේ නිසා සිත ඉපිලේ 10 මුහුණ

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | | 3 | ■ |
| 4 | | ■ | 5 | 6 |
| 7 | | 8 | ■ | |
| | ■ | 9 | 10 | |
| ■ | 11 | | | |

**ගියවර නිවැරදි විසඳුම්**

**හරහට:** 1 සිදාදිය 4 තිත 5 සක 7 විමන 9 දවස 11 මක්කම
**පහළට:** 1 සිතිවිලි 2 දාතම 3 යස 6 කලිසම 8 නදක් 10 වක

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# උළුහාල් ව්‍යංජනය
## FENUGREEK CURRY

**අවශ්‍ය ද්‍රව්‍ය :**
උළුහාල් — ග්‍රෑම් 100 යි
බැද කුඩුකරගත් තුනපහ කුඩු — මේස හැඳි 1 යි
මිරිස් කුඩු — මේස හැඳි 1 යි
සිහින්ව ලියන ලද රතුළූණු — ගෙඩි 5 යි
සිහින්ව ලියන ලද සුදුළූණු — ගෙඩි 10 යි
උම්බලකඩ කුඩු — මේස හැඳි 1 යි
සිහින්ව ලියන ලද අමු මිරිස් — කරල් 2 යි
දිය කිරි (Half - fat milk) — කෝප්ප 1 යි
මිටිකිරි (Full - cream milk) — කෝප්ප 1 යි
එළවළු තෙල් — මේස හැඳි 2 යි
රම්පෙ කරපිංච කුරුඳු ටිකක්
ලුණු සහ කහ ස්වල්පයක්

**සාදන ක්‍රමය :** සාස්පානකට එළවළු තෙල් දමා ලිපතබා, සෝදා පිරිසිදු කරගන්නා ලද උළුහාල් එයට දමා බැදෙන්න හරින්න. එය බැදෙන විට සිහිනියට ලියන ලද රතුළුණු, සුදුළුණු, අමු මිරිස්, රම්පෙ, කරපිංචා, කුරුඳු පොතු, උම්බලකඩ කුඩු ආදියද එයටම දමා හොඳින් බැදෙන්න හරින්න. ඉන් පසු දිය කිරි කෝප්පයට බැද කුඩුකරගත් තුනපහ කුඩු, මිරිස් කුඩු, කහ, ලුණු ආදිය මිශ්‍ර කොට උළුහාල් මිශ්‍රණයට දමන්න. දැන් ඉස්ම හොඳින් සිඳීගෙන එන විට මිටිකිරි කෝප්පයට තක්කාලි ගෙඩිය කුඩාවට කපා දමා එය උළුහාල් ව්‍යංජනයට එක්කර ඉස්ම මඳක් තිබෙන්නට පිසගන්න. මෙම ව්‍යංජනය රසවත් මෙන්ම ගුණදායක ය.

♦ කමලිකා London